**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016**

**Primary Piriven Year End Term Test - 2016**

3 වසර /**Grade** 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල**

**SINHALA**

**කාලය : පැය** 03 **යි.**

**Time : Three hours**

**පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200කට නො අඩු රචනයක් ලියන්න.

i. මා ගිය අධ්‍යාපන චාරිකාව.

ii. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

iii. සාරධර්ම සුරැකීමේ වැදගත්කම

iv. රට බේරාගත් මහා විජයබාහු රජතුමා

v. මහ මග අනතුරු වළකමු.

(ලකුණු 25)

02. අ) වර්ගාන්තාක්ෂර සහ සඤ්ඤකාක්ෂර ලියා දක්වන්න.

(ලකුණු 05)

ආ) වරහන් තුළ ඇති නිවැරදි වචනය තෝරන්න.

i. (විෂ්ණු / විෂ්නු) දෙවියෝ.

ii. පින් (දෙන / දෙණ) ගාථාව.

iii. විෂ (උරණ /උරන) බෙහෙත්.

iv. (දරුණු / දරුනු) නියඟය.

v. පොර (කන / කණ) බල්ලෝ. (ලකුණු 05)

ඇ) හිස්තැනට අදාළ නිවැරදි අකුර වරහන් තුළින් තෝරන්න.

i. ය..........ර්ථය (තා / ථා)

ii. අනාථ පි..........ඩික (ණ් / න්)

iii. මධුභා..........ණිය. (ශි / ෂි)

iv. පරි..........ණකය (ස / ග)

v. කා..........ගුණය (ළ / ල). (ලකුණු 05)

03. අ) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.

i. ගුරුතුමා විසින් මම පැසසුණෙමි.

ii. පරිවේණාධිපති හිමියන් විසින් ශිෂ්‍යයෝ ඇමතෙති.

iii. මව විසින් දරුවෝ සැනසෙති.

iv. දෙමාපියන් විසින් අපි රැකුණෙමු.

v. කම්කරුවන් විසින් පාලම තනනු ලබයි. (ලකුණු 10)

ආ) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

i. මිනිසුන් දිනපතා වැඩට යති.

ii. සඟරුවන මහ මග වඩිති.

iii. කණඋන්දෑ නා ගහ මුල ගෙදර විසී ය.

iv. කුමරිය මාළිගයට ගියේ ය.

v. අයෙක් සුරා මතින් නටයි.

(ලකුණු 05)

04. අ) පහත සඳහන් පදවල විරුද්ධ පදය ලියන්න.

i. බාහිර = .........................

ii. ආත්මාර්ථකාමී = .........................

iii. සොම්නස = .........................

iv. නුවණ = .........................

v. ප්‍රකට = .........................

(ලකුණු 05)

ආ) පහත සඳහන් පද සඳහා සමාන පද 02 බැගින් ලියන්න.

i. වනය = .......................................

ii. අලංකාරය = .......................................

iii. උපකාරය = .......................................

iv. පුරාණ = .......................................

v. සිරගෙය = .......................................

(ලකුණු 05)

ඇ) පහත දැක්වෙන පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

i. වලහා = .........................

ii. කොවුලා = .........................

iii. ළදරුවා = .........................

iv. නළුවා = .........................

v. මෙහෙකරුවා = .........................

(ලකුණු 05)

05. අ) පහත සඳහන් පදවලට යෝග්‍ය උපසර්ග යොදා නැවත ලියන්න.

i. මිහිරි = .........................

ii. කීර්ති = .........................

iii. දුක් = .........................

iv. වර්ධනය = .........................

v. නම්බුව = .........................

(ලකුණු 05)

ආ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කර දක්වන්න.

i. සුවඳ + ඇති = ..........................

ii. සුර + ඉඳු = ..........................

iii. උදර + ආබාධ = ..........................

iv. ඔබින් + ඔබ = ..........................

v. වම් + අත = ..........................

(ලකුණු 05)

ඇ) පහත සඳහන් පද කවර සමාස වර්ගයට අයත් දැයි දක්වන්න.

i. රතුමල ii. බුදුගුණ iii. ඉරහඳ

iv. කිරිබත් v. සියපත් (ලකුණු 05)

06. බුදුගුණ අලංකාරයේ ඔබ කැමති කවි 03ක් ලියා එහි අර්ථය ද ලියා දක්වන්න.

(ලකුණු 15)

07. අපගේ ජීවිතය හැඩගස්වා ගැනීමට වටිනා උපදේශයන් සපයන කෘතියක් ලෙස ''වනකතා" කෘතියේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

08. උම්මග්ග ජාතකයේ පැන විසඳුම් කොටසින් ඔබ වඩාත් සිත්ගත් ප්‍රශ්නයක් දක්වා මහෞෂධ පඬිතුමා එය විසඳූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)